# වෘත්තීය ධුරාවලිය තුළ පුස්තකාලයාධිපති වෘත්තියෙහි ස්ථානගත වීම පිළිබඳ ශ්‍රී ලාංකේය සාහිත්‍ය විමර්ශනය

# The professional prestige of librarians among the other professions: A literature review based on Sri Lanka

**ආචාර්ය ආර්. ඩී. ආනන්ද තිස්ස**[1]

**Dr. R. D. Ananda Tissa**[1]

## Abstract

Library Profession has a history around 5000 years. It began with the origin and gradual development of ancient scripts writing tradition and its related materials. Library service in Sri Lanka began as a community contribution with a religious origin. Origin of library profession commenced in 19 century however, it was developed as a highly accepted profession in the 20th century. There are several factors involving the progress and development of a profession. Social recognition is one of the leading factors. The principal objective of the study is to investigate the hierarchy of the Professional prestige of librarians to study with reference to Sri Lankan literature

**Keywords:** Librarianship, Library profession, Professional prestige, Social recognition

*[1] ජ්‍යෙෂ්ඨ සහකාර පුස්තකාලයාධිපති*
*ගම්පහ වික්‍රමාරච්චි ආයුර්වේද විද්‍යායතනය කැලණිය විශ්වවිද්‍යාලය, යක්කල.*
*email:rdatissa@gmail.com*

**සාර සංග්‍රහය**

වර්ෂ 5000ක ඉතිහාසයක් ඇති පුස්තකාලය වෘත්තිය, අක්ෂර හා ලේඛන ආරම්භ වූ තැන් පටන් පෙරපර දෙදිග රටවල වර්ධනය වූවකි. සමාජ මෙහෙවරක යෙදෙන මහජන සේවා මධ්‍යස්ථානයක් වශයෙන් පුස්තකාලය සම්ප්‍රදාය ශ්‍රී ලංකාවේ ද පැවතිණි. දැනුම බෙදාහරින කේන්ද්‍රීය ආයතනය වශයෙන් පුස්තකාලය සම්භාවනාවට පත්විය. වර්තමාන අර්ථයෙන් පුස්තකාලය වෘත්තිය දියුණුවීම ආරම්භ වූයේ 19 වන සියවස වුවත්, විද්වත් වෘත්තියක් බවට පරිවර්තනය වූයේ 20 වන සියවසේ දී ය. වෘත්තියක් විද්වත් වෘත්තියක් බවට පත්වීමට බලපාන සාධක කීපයකි. ඒ අතර සමාජ පිළිගැනීමට අද්විතීය තැනක් හිමි වේ. මෙම පර්යේෂණ අධ්‍යයනයේ ප්‍රධාන අරමුණ වන්නේ පුස්තකාලයාධිපතිවරුන්ගේ වෘත්තියෙහි ස්ථානගත වීම පිළිබඳ ශ්‍රී ලාංකීය සාහිත්‍ය විමර්ශනය යි.

මූලික පද : පුස්තකාලයාධිපතිත්වය, පුස්තකාල වෘත්තිය, වෘත්තියෙහි ස්ථානගත වීම, සමාජ පිළිගැනීම

## හැඳින්වීම

පුස්තකාල වෘත්තියෙහි වෘත්තීය ගරුත්වය පිළිබඳ පිළිබඳ දේශීය හා ජාත්‍යන්තර සාහිත්‍ය විමර්ශනය කිරීමේ අවස්ථා තිබේ. කිසියම් වෘත්තියක ආරම්භය පිළිබඳ පසුබිම අධ්‍යයනයේ දී ඒ සඳහා පාදක වන සාහිත්‍යමය මූලාශ්‍ර විමර්ශනය, නිවැරැදි තොරතුරු අධ්‍යයනය සඳහා ශාස්ත්‍රීය කාර්යභාරයක් ඉටුකරයි. මිනිසා විසින් ස්වකීය මතවාදයන් ප්‍රකාශනය සඳහා අක්ෂර හා ලේඛන කලාවක් නිර්මාණය කරන ලද්දේ ඉතිහාසයේ යම් වකවානුවක ද, ලේඛන සංරක්ෂණය පිළිබඳ සංකල්පය හෙවත් පුස්තකාල සම්ප්‍රදාය හා ලේඛන ආරක්ෂා කර ගැනීම පිළිබඳ ඉතිහාසයත් ඒ වකවානුව දක්වා ම ඈතට දිවයයි.

වෘත්තීය ගරුත්වයෙහි ස්ථානය අධ්‍යයනය කිරීම වූකලී, කිසියම් සමාජයක පුද්ගලයෙකුගේ සමාජ ස්ථාපනයන් මැනීම සඳහා භාවිත කෙරෙන ජනප්‍රිය මිනුම් ක්‍රමයකි. ආදායම් හා අධ්‍යාපනය වැනි අන්‍ය මිනුම් ක්‍රම හා සමඟ එක්ව භාවිත කළොත් එය සමාජ ආර්ථික තත්ත්ව මිනුවක් වශයෙන් ද ඵලදායී වනු ඇත. වෘත්තීය ගරුත්ව ස්ථානයක් සැලසුම් කිරීම සඳහා ප්‍රථම ශ්‍රී ලාංකේය පරිශ්‍රමය දරන ලද්දේ 1978 දී සුසිලා නීල්ස් විසිනි. එය විශේෂයෙන් ම, ශ්‍රී ලංකාව සඳහා නිර්මාණය කරන ලද්දක් වුව ද, ඊට පාදක වූයේ සීමාසහිත නියැදියකට ලැබුණු ප්‍රතිචාරයන් ය.

## පුස්තකාල වෘත්තියෙහි ගරුත්වය පිළිබඳ ඓතිහාසික සාහිත්‍ය විමර්ශනය

ලේඛන කලාවේ ආරම්භයත් සමඟම පුස්තකාලවල හා පුස්තකාල වෘත්තියෙහි සමාරම්භය ද සිදු වූ බව චිරප්‍රසිද්ධ ය. ක්‍රි. පූ. තුන්වන සියවසට පෙර මෙසපොටේමියාවෙන් හමු වූ මැටි පුවරුවෙන් ආරම්භ වූ ලේඛන කලාව ඊජිප්තුවෙන් හමු වූ පැපිරස් රෝල් දක්වා ව්‍යාප්ත විය. නිනේවා පුස්තකාලයේ නටබුන්

සොයාගන්නා ලද්දේ බ්‍රිතාන්‍යයේ සුප්‍රකට පුරාවිද්‍යාඥයකු වූ ශ්‍රීමත් ඔස්ටින් හෙන්රි ලෙයාර්ඩ් විසින් 1853 දී ය. (වීරසිංහ, 2000, පි. 7) සමහර ලේඛන පරිවර්තනය, සංස්කරණය කරන ලද අතර එම පුස්තකාලය සඳහා වෙනම රාජකීය පුස්තකාලයාධිපතිවරයෙක් ද (එහි ම, පි. 8) පත්කර ඇත. මෙලෙස ඉතා දියුණු තත්ත්වයක තිබූ ඇසිරියානු ශිෂ්ටාචාරය පර්සියානු ආක්‍රමණිකයන් විසින් විනාශ කර දමන ලදි. විනාශ කළ පුස්තකාලයේ නටබුන්වලට යට වී තිබූ මැටිපුවරු 19 වන සියවසේ පුරාවිද්‍යා කැණීම් කරන තෙක්ම, වර්ෂ 2500ක් පමණ (එහි ම, පි. 9) නොනැසී පැවතුණි.

පුරාණ සුමේරියන්වරුන්, බැබිලෝනියන්වරුන්, ඇසිරියන්වරුන් සහ හිට්ටිවරුන් මෙම මැටි පුවරු ලිපි භාවිත කළ බවට සාක්ෂි තිබේ. ග්‍රීක හා යුරෝපීය හෝඩි නිර්මාණය වූයේ ද ෆිනීෂියානු හෝඩිය ඇසුරින් බව මෙහි ලා විශේෂයෙන් සඳහන් කළ යුත්තේ බටහිර ලෝකයට අක්ෂර හා ලේඛන කලාව පිළිබඳ දායාදය හිමි වූයේ පෙරදිගින් බව ඉන් ප්‍රකාශ වන හෙයිනි. මේ අනුව පුස්තකාල ඉතිහාසයේ ආරම්භය පෙරදිග ලෝකය හා සම්බන්ධ වූ බව පැහැදිලි වේ.

විද්‍යමාන පුස්තකාලයාධිපතිත්වය හා එහි ආරම්භක ඓතිහාසික කතා ප්‍රවෘත්තිය සුමේරියන්වරුන්ගේ සිට ආරම්භ වේ. ගිණුම් වාර්තා පවත්වා ගැනීම පිණිස ලිපිකරුවන් පුහුණු කළ ප්‍රථම ජාතිය වශයෙන් මොවුහු ගෞරවාදරයට පාත්‍ර වූහ. සංකීර්ණත්වයෙන් පිරිපුන් එකී වාර්තා අතිවිශාල ප්‍රමාණයක් හැසිරවීම හා මෙහෙයවීම පිණිස පුහුණු කරන ලද ලියන්නෝ (පිටපත් කරන්නෝ) හා පූජකයෝ සත්‍ය වශයෙන් ම 'පුස්තක විශේෂඥයෝ' හෙවත් 'පොත් පාලකයෝ' (Masters of Books) හෝ 'මැටි පුවරු ආරක්ෂකයෝ' බවට පත්වූහ. බැබිලෝනියා (Babiloniya) අක්කාඩ් (Akkad) ඇසිරියා (Assriya) යන ශිෂ්ටාචාර වසර 2000ක් පමණ පැවතී ඇත. මෙම සියලු ශිෂ්ටාචාරයන් හඳුන්වනු ලබන්නේ මෙසපොතේමියානු ශිෂ්ටාචාරය වශයෙනි. 'මෙසපොතේමියාව' යන්නෙහි අදහස දෙගම්මැදි රාජ්‍ය (The Land between The Rivers) බව ඉතිහාස ග්‍රන්ථයන්හි සඳහන් වෙයි.

වෘත්තීය ගරුත්වය හා වෘත්තියක් වශයෙන් ස්ථානගත වීම පිළිබඳ ශ්‍රී ලාංකේය සාහිත්‍ය විමර්ශනය අංශ දෙකක් යටතේ සිදු කෙරේ. පළමුවැන්න, වෘත්තියක් වශයෙන් පොදු අර්ථයෙන් පුස්තකාල වෘත්තියෙහි පිළිගැනීම ශ්‍රී ලාංකික සන්දර්භය යටතේ හඳුනා ගැනීම යි. මෙහි දී රාජ්‍ය හා පළාත් රාජ්‍ය සේවාවට අදාළ පුස්තකාලයාධිපතිවරු පිළිබඳ සඳහන් වන නමුත් විශ්වවිද්‍යාල, පර්යේෂණ ආයතන ආදී විශේෂිත ක්ෂේත්‍රවල සේවය කරන පුස්තකාල වෘත්තිකයක් ආවරණය නො වේ. දෙවැන්න, පුස්තකාල වෘත්තියෙහි වෘත්තීය ගරුත්වය පිළිබඳ මාතෘකාවට අදාළ සාහිත්‍ය මූලාශ්‍රය විමර්ශනය කිරීමෙන් අනතුරුව ඒවා උද්ධරණ සහිතව සුදුසු ස්ථානවල සඳහන් කිරීම යි. මේ අංශ දෙකට අමතරව පුස්තකාලයාධිපතිත්වය හා පුස්තකාල වෘත්තියෙහි රැකියා තෘප්තියට අදාළව දේශීයව සිදු වූ පර්යේෂණ අධ්‍යයනයන් ද සුදුසු පරිදි පාදක කර ගැනීමේ අවස්ථා නිරීක්ෂණය කෙරිණි.

පුස්තකාල වර්ගය අනුව රාජ්‍ය, පළාත් රාජ්‍ය හෝ අර්ධ රාජ්‍ය පුස්තකාල සේවාවට අදාළ ආයතනික රාමුව, බඳවාගැනීමේ පටිපාටි, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ සඳහන් විවිධ රෙගුලාසි, වැටුප්, දීමනා හා වරප්‍රසාද ආදී වශයෙන් පනවනු ලබන නීතිමය ප්‍රතිපාදනත් එහි දී විශේෂයෙන් අදාළ වේ. පුස්තකාලයාධිපතිත්වය ජාතික වශයෙන් මෙරට පිළිගැනීමට ලක් වී ඇති අයුරු නිදසුන් කීපයක් ඇසුරෙන් අධ්‍යයනය කළ හැකිය.

**රාජ්‍ය සේවා පුස්තකාල වෘත්තියෙහි ගරුත්වය පිළිබඳ නෛතික ලේඛන**

1994.08.10 දිනැති අංක 94/550/055 දරන අමාත්‍ය මණ්ඩල තීරණය අනුව පුස්තකාලයාධිපතිවරුන් විද්වත් වෘත්තිකයන් වශයෙන් පිළිගෙන ඇත. 100.24 අමාත්‍ය මණ්ඩල පත්‍රිකා 94/550/055 වූ 'රාජ්‍ය සේවයේ පුස්තකාලයාධිපතිවරුන් සඳහා ඒකාබද්ධ සේවා ව්‍යවස්ථාවක් ක්‍රියාත්මක කිරීම' සඳහා රාජ්‍ය පරිපාලන ඇමතිතුමා ඉදිරිපත් කළ 1994.05.23 දිනැති සංදේශය සලකා බලා, ඒකාබද්ධ පුස්තකාල සේවයක් සඳහා සේවා ව්‍යවස්ථාවක් සකස්කිරීම පිණිස පත්කරන ලද කමිටුව මගින් කරන ලද යෝජනා අනුව ව්‍යවස්ථාව ක්‍රියාත්මක වේ. 6/2006 (ii) වැටුප් චක්‍රලේඛයේ දී පුස්තකාලයාධිපති වෘත්තියට මධ්‍ය හෙවත් තාක්‍ෂණික ක්ෂේත්‍රය වන එම්එන් (Management Assistants Non technical - MN) වැටුප් පරිමාණය ලබා දී ඇත.

ශ්‍රී ලංකාවේ පුස්තකාල වෘත්තියෙහි පිළිගැනීම කුමන මට්ටමකින් පවතින්නේ දැයි හඳුනාගැනීමට විවිධ සම්මතයන්, ප්‍රමිති හා වර්ගීකරණයන් ද පාදක වේ. පුස්තකාල වෘත්තියේ ස්ථාපනය පිළිබඳ ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවේ නියැදි සමීක්‍ෂණ අංශය මගින් වර්ෂ 2008 දී ප්‍රකාශිත ශ්‍රී ලංකාවේ සම්මත රැකියා වර්ගීකරණය හෙවත් (Sri Lanka Standards Classification of Occupations-SLSCO) යන වර්ගීකරණයට අනුව (සම්මත, 2008) පුස්තකාලයාධිපතිවරුන් වෘත්තිකයන්ගේ කාණ්ඩය යටතේ ඇතුළත් කර ඇත. මෙම වර්ගීකරණයෙහි ප්‍රධාන වෘත්තීය කණ්ඩායම් (10) දහයකි.

ශ්‍රී ලංකාවේ පුස්තකාලයාධිපතිවරුන්ගේ වෘත්තීය ගරුත්වයෙහි පර්යේෂණාත්මකව අධ්‍යයනය සඳහා රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශය විසින් 2016.02.25 දින නිකුත් කර ඇති චක්‍රලේඛය අනුව (PA 03/2016) වැටුප් හා සේවක සංඛ්‍යාන කොමිෂන් සභාවේ වැටුප් පරිවර්තන චක්‍ර සූචිය 11 වන පරිශිෂ්ටයේ දැක්වෙන තනතුරු නාමාවලියෙහි ය පුස්තකාලයාධිපතිත්වය අංක 36 යටතේ සඳහන් වීම මූලාශ්‍රයක් වශයෙන් භාවිත කෙරේ. මෙහි දී සමස්ත පුස්තකාල සේවාව නොව රජයේ හා පළාත් පාලන ආයතන පුස්තකාල පාදක වී ඇති බව නිරීක්‍ෂණය වේ.

| # | * සේවාව / තනතුර |
|---|---|
| 01 | අධිකරණ නිලධාරීන් |
| 02 | නීති නිලධාරීන් |

| | |
|---|---|
| 03 | රාජ්‍ය සේවය (අමාත්‍ය මණ්ඩල ලේකම්/අමාත්‍යාංශ ලේකම්/දිසාපති) |
| 04 | ශ්‍රී ලංකා පරිපාලන සේවය |
| 05 | ශ්‍රී ලංකා ඉංජිනේරු සේවය |
| 06 | ශ්‍රී ලංකා විද්‍යාත්මක සේවය |
| 07 | ශ්‍රී ලංකා කෘෂිකර්ම සේවය |
| 08 | ශ්‍රී ලංකා සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය |
| 09 | ශ්‍රී ලංකා සැලසුම් සේවය |
| 10 | ශ්‍රී ලංකා විදේශ සේවය |
| 11 | ශ්‍රී ලංකා දේශීය ආදායම් සේවය |
| 12 | ශ්‍රී ලංකා ගණකාධිකාරී සේවය |
| 13 | ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවය |
| 14 | ශ්‍රී ලංකා වාස්තු විද්‍යාඥ සේවය |
| 15 | ශ්‍රී ලංකා විගණන සේවය |
| 16 | ශ්‍රී ලංකා විගණන පරීක්ෂක සේවය |
| 17 | වෛද්‍ය නිලධාරීන් |
| 18 | ශ්‍රී ලංකා පොලිසිය |
| 19 | ශ්‍රී ලංකා රේගුව |
| 20 | ශ්‍රී ලංකා මිනින්දෝරු සේවය |
| 21 | ලියාපදිංචි සහකාර වෛද්‍ය නිලධාරීන් |
| 22 | ඒකාබද්ධ තැපැල් සේවය (තැපැල්පති/උපතැපැල් ස්ථානාධිපති) |
| 23 | ශ්‍රී ලංකා මුද්‍රණ සේවය |
| 24 | සාමාන්‍ය ලිපිකරු හා පළාත් ලිපිකරු |
| 25 | ලඝුලේඛක සේවය (අධි ශ්‍රේණිය, හා 1,-11,111 ශ්‍රේණි) |
| 26 | යතුරු ලේඛක සේවය (අධි ශ්‍රේණිය, 1,11 'අ' 'ආ' ඛණ්ඩ) |
| 27 | සරප් සේවය |
| 28 | භාෂා පරිවර්තක සේවය |
| 29 | පොත් තබන්නන්ගේ සේවය |
| 30 | ගබඩා භාරකරුවන්ගේ සේවය |
| 31 | කාර්යාල සේවක සේවය |
| 31 | කාර්යාල සේවක සේවය |
| 32 | කම්කරු ශ්‍රේණිය/කාර්මික ශිල්පීය ශ්‍රේණි |
| 33 | මෝටර් රථ රියදුරන් |
| 34 | ගබඩා ලිපිකරු/ගබඩා භාරකරුවන් |
| 35 | කම්කරු නිලධාරීන් |
| 36 | පුස්තකාලයාධිපතිවරුන් (අධි ශ්‍රේණිය, හා 1,-11,111 ශ්‍රේණි) |

| | |
|---|---|
| 37 | සුබසාධක නිලධාරීන් |
| 38 | ශ්‍රී ලංකා තාක්ෂණ සේවය/තාක්‍ෂණ ශිල්පී |
| 39 | ග්‍රාම නිලධාරීන් (අධි ශ්‍රේණිය, හා 1,-11,111 ශ්‍රේණි) |
| 40 | සෞඛ්‍ය අධ්‍යාපන නිලධාරීන් |
| 41 | පරිවාස නිලධාරීන් |
| 42 | ශ්‍රී ලංකා ගුරු සේවය |
| 43 | ශ්‍රී ලංකා විදුහල්පති සේවය |
| 44 | ශ්‍රී ලංකා ගුරු අධ්‍යාපනඥ සේවය |
| 45 | උපලේඛණගත (උසාවි) නිලධාරීන් (ශ්‍රේෂ්ඨාධිකරණය/අධිකරණය) |
| 46 | ශ්‍රී ලංකා මැනුම් සහායක සේවය |

මූලාශ්‍රය : වැටුප් පරිවර්තන චක්‍ර සූචිය 11 වන පරිශිෂ්ටය වගු අංකය : 01

පූර්වෝක්ත චක්‍රලේඛයෙහි පුස්තකාලයාධිපති වෘත්තිය සඳහන් වන්නේ පොදු අර්ථයෙන් වන අතර මහජන, පාසල්, විශේෂ හා විශ්වවිද්‍යාල පුස්තකාලයාධිපතිත්වය වෙන් වෙන් වශයෙන් සඳහන් නොවේ. විශ්වවිද්‍යාල පුස්තකාලයාධිපතිත්වය විශේෂිත සේවාවකි. 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනත හා එම පනතට අදාළ සංශෝධන ඇසුරෙන් එය පැහැදිලි වේ.

(අ). 1978 අංක 16 දරන ලංකා විශ්වවිද්‍යාල පනත

1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ විශ්වවිද්‍යාල පුස්තකාලයාධිපතිත්වයට විශ්වවිද්‍යාල පරිසරයෙහි පිළිගැනීම පිළිබඳ ව දැක්වෙන උධෘත කීපයක් අදාළ පිටු අංක සහිතව සැකෙවින් මෙසේ සඳහන් කළ හැකිය.

21. පිටුව VI වන කොටස, විශ්වවිද්‍යාලවල කුලපතිවරුන් හා නිලධරයෝ

39.1 පුස්තකාලයාධිකාරිවරයා

27. පිටුව VII වන කොටස, විශ්වවිද්‍යාලයක බල මණ්ඩලය

46.1 සනාතන සභාව (ඊ) පුස්තකාලයාධිකාරිවරයා හෝ ඔහුගේ නාමිකයා ;

29. පිටුව 48.1 විශ්වවිද්‍යාලයේ පීඨ (ආ) පුස්තකාලයාධිකාරිවරයා ; සහ

34. පිටුව IX වන කොටස

විශ්වවිද්‍යාලයීය විද්‍යායතනයක නිලධරයන්

බලමණ්ඩලය සහ ඔවුන්ගේ බලතල, කාර්ය හා කර්තව්‍යයන්

56. විශ්වවිද්‍යාලයීය විද්‍යායතනයක නිලධරයෝ

(4) පුස්තකාලයාධිකාරිවරයා සහ

36. පිටුව 60. (1) හා (2) පුස්තකාලයාධිකාරිවරයා තෝරාපත් කර ගැනීම

38. පිටුව 64.1 ශාස්ත්‍රීය කමිටුව (ඈ) පුස්තකාලයාධිකාරිවරයා හෝ ඔහුගේ නාමිකයා ;

39. පිටුව 65. (1) හා (2) (ආ) විශ්වවිද්‍යාලයීය විද්‍යායතනයක පීඨ

43. පිටුව 79. අර්ථ නිරූපණය 'ආචාර්යවරයා'

48. පිටුව IX වන කොටස විශ්වවිද්‍යාලයවල අර්ථසාධක අරමුදල 89 (ආ) 'ආචාර්යවරයා'

78. පිටුව XXI වන කොටස අර්ථ නිරූපණය 147 'ආචාර්යවරයා'

(ආ). 1985 අංක 07 දරන විශ්වවිද්‍යාල (සංශෝධන) පනත

11. පිටුව 26. 2 (එ) ප්‍රධාන ප්‍රඥප්තියේ 46 වන වගන්තිය සංශෝධනය කිරීම

16. පිටුව 35. 1 (ඉ) ප්‍රධාන ප්‍රඥප්තියේ 64 වන වගන්තිය සංශෝධනය කිරීම

21. පිටුව 40 72 (1) ආචාර්ය තනතුරකට පත්කිරීම

22. පිටුව 44 අර්ථ නිරූපණය 'ආචාර්යවරයා'

23,24. පිටු 48 (අ), (ආ) 'ආචාර්යවරයා'

2003 වර්ෂයේ දී තිස්ස දේවේන්ද්‍ර මහතාගේ සභාපතිත්වයෙන් යුතු පළමුවැනි වැටුප් කොමිසම මගින් සියලුම වෘත්තීය සමිති සම්බන්ධ කරගෙන ජාතික වැටුප් ප්‍රතිපත්තියක් සැකසීමට අවශ්‍ය මූලික කටයුතු සකස්කරන ලදි. එහි ප්‍රතිඵලයක් වශයෙන් 6/2006 වැටුප් ප්‍රතිපත්තිය එළිදක්වන ලදි. එහි දී සමස්ත රජයේ සේවකයෝ කොටස් හතරකට වර්ගීකරණය කර ඇත. ඒවා නම්, (අ). ප්‍රාථමික හෙවත් කම්කරු ක්ෂේත්‍රය, (ආ). මධ්‍ය හෙවත් තාක්‍ෂණික ක්ෂේත්‍රය, (ඇ). විධායක මට්ටම හා (ඈ). ඉහළ විධායක මට්ටම වශයෙනි.

යථෝක්ත චක්‍රලේඛය තුළ රාජ්‍ය සේවාවට අදාළ පුස්තකාලයාධිපති සේවාව කුමන ක්ෂේත්‍රයක් යටතේ සඳහන් කර තිබේ ද යන්න අපැහැදිලි නිසා නැවත චක්‍රලේඛයක් නිකුත් කෙරිණි. 6/2006 (ii) වශයෙන් නිකුත්කරන ලද එම වැටුප් චක්‍රලේඛයේ දී පුස්තකාලයාධිපති වෘත්තියට කළමනාකරණ සහකාර තාක්‍ෂණික නොවන (Management Assistants Non technical-MN) වැටුප් තල ලබා දී ඇත.

පුස්තකාල වෘත්තියෙහි ස්ථානගත වීම පිළිබඳ අධ්‍යයන

ශ්‍රී ලංකාවේ සම්මත රැකියා වර්ගීකරණයෙහි සඳහන් වන ප්‍රධාන වෘත්තීය කාණ්ඩ (1 සිට 0 දක්වා) මෙහි දැක්වේ. මෙහි දී පුස්තකාල වෘත්තිය නියෝජනය කෙරෙන අංක

2 යටතේ සඳහන් වෘත්තිකයින් පිළිබඳ තොරතුරු සඳහන් වේ. වෘත්තිකයන් පිළිබඳව එක් එක් ක්ෂේත්‍රයන් යටතේ කරුණු දක්වා ඇත.

| කාණ්ඩ වර්ගය | ප්‍රධාන කාණ්ඩ | උප-ප්‍රධාන කාණ්ඩ | අප්‍රධාන කාණ්ඩ | ඒකක කාණ්ඩ |
|---|---|---|---|---|
| නියෝජනය වන අංක | 1, 2, 3 ආදී වශයෙන් 0 දක්වා | 2 | 3 | 4 |
| වෘත්තීන් ගණන | 10 | 43 | 130 | 310 |

මූලාශ්‍රය : ජාත්‍යන්තර කම්කරු කාර්යාලය වගු අංකය : 02

1. කළමනාකරුවෝ
2. වෘත්තිකයෝ
3. කාර්මිකයෝ හා සහාය වෘත්තිකයෝ
4. ලිපිකරුවෝ
5. සේවා ශ්‍රමිකයෝ සහ සාප්පු හා වෙළඳ සේවකයෝ
6. පුහුණු කෘෂිකාර්මික හා ධීවර ශ්‍රමිකයෝ
7. නිර්මාණ ශිල්පීන් හා සම්බන්ධ ශ්‍රමිකයෝ
8. යන්ත්‍රාගාර හා යන්ත්‍ර ක්‍රියාකරුවෝ සහ එකලස්කරුවෝ
9. මූලික හෙවත් ප්‍රාථමික වෘත්තීන්

0. රැකියා අනුව වර්ග නොකරන ලද හා ආරක්ෂක හමුදා වෘත්තීන්

පූර්වෝක්ත වර්ගීකරණයෙහි අංක 2 යටතේ සඳහන් වෘත්තිකයෝ (Major Group 2 - Professionals) යටතේ සඳහන් වෘත්තිකයෝ උප ප්‍රධාන කාණ්ඩයෙහි 21, 22, 23, 24, 25 හා 26 යටතේ නැවතත් වෘත්තීන් වශයෙන් වර්ග කර ඇත. 26 නීති, සමාජීය හා සංස්කෘතික වෘත්තිකයන් නියෝජනය වනසේ වර්ගීකරණය කෙරේ.

1. කළමනාකරුවන්, ජ්‍යෙෂ්ඨ නිලයන් සහ නීති සම්පාදකයන්
2. වෘත්තිකයින්
3. තාක්ෂණිකයන් සහ ආශ්‍රිත වෘත්තිකයින්
4. ලිපිකරු සහ ලිපිකරු සහාය සේවකයන්

5. සේවා හා විකුණුම් සේවකයන්
6. පුහුණු කෘෂිකාර්මික, වන විද්‍යා සහ ධීවර සේවකයින්
7. ශිල්පීය සහ ආශ්‍රිත කර්මාන්ත සේවකයින්
8. යන්ත්‍රාගාර හා යන්ත්‍ර ක්‍රියාකරුවන් සහ එකලස්කරුවන්
9. මූලික රැකියාවන්
0. රැකියා අනුව වර්ග නොකරන ලද හා ආරක්ෂක හමුදා වෘත්තීන්

පූර්වෝක්ත වර්ගීකරණයෙහි අංක 2 (Group 2 - Professionals) යටතේ සඳහන් වෘත්තිකයින් උප ප්‍රධාන කාණ්ඩයෙහි 21 සිට 26 දක්වා වෘත්තිකයින් නැවතත් වෘත්තීන් වශයෙන් වර්ග කර ඇත.

21. Science and Engineering Professionals (විද්‍යා හා ඉංජිනේරු වෘත්තිකයෝ)
22. Health Professionals (සෞඛ්‍ය වෘත්තිකයෝ)
23. Teaching Professionals (ගුරු වෘත්තිකයෝ)
24. Business and Administration Professionals (ව්‍යාපාර හා පරිපාලන වෘත්තිකයෝ)
25. Information and commiunication Technology Professionals (තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ වෘත්තිකයෝ)
26. Law, Social and Cultural Professionals (නීති, සමාජීය සහ සංස්කෘතික වෘත්තිකයෝ)

    261. නීති වෘත්තිකයින්

    262. පුස්තකාලයාධිපතින්, ලේඛනාරක්ෂකයින් සහ කෞතුකාගාර භාරකරුවන්

        2621. ලේඛනාරක්ෂකයින් සහ කෞතුකාගාර භාරකරුවන්

        2621. පුරාවිද්‍යාඥ

        2621. ලේඛනාරක්ෂක

        2621. වෙනත් ලේඛනාරක්ෂකයින් සහ කෞතුකාගාර භාරකරුවන්

        2621. චිත්‍රපට ලේඛනාරක්ෂක

        2622. පුස්තකාලයාධිපතින් සහ ආශ්‍රිත තොරතුරු වෘත්තිකයින්

        2622. පුස්තකාලයාධිපති

        2622. කනිෂ්ඨ සහකාර පුස්තකාලයාධිපති

2622. පුස්තකාලයාධිපති - පර්යේෂණ

263. සමාජ සහ ආගමික වෘත්තිකයින්

2632. සමාජ විද්‍යාඥයින්, මානව විද්‍යාඥයින් හා සහ ආශ්‍රිත වෘත්තිකයින්

262 යටතේ පුස්තකාලයාධිපතීන්, ලේඛනාරක්ෂකයින් සහ කෞතුකාගාර භාරකරුවන් දක්වා ඇත. මෙම වර්ගීකරණය ජාත්‍යන්තර කම්කරු කාර්යාලය (International Labour Office - ILO) මගින් ප්‍රකාශිත ජාත්‍යන්තර ප්‍රමිත වෘත්තීය වර්ගීකරණය හෙවත් (International Standards Classification of Occupations - ISCO) නමින් හැඳින්වේ. ට්‍රෙයිමන්ට අනුව (Treiman, 1975) ඔහු හඳුන්වා දුන් ප්‍රමිත ජාත්‍යන්තර වෘත්තීය ස්ථානගත කිරීම් (Standard International Occupational Prestige Scale - SIOPS) හා ඥාතිත්වයක් පෙන්නුම් කෙරේ. යම් යම් ස්ථානගත කිරීම් අතර සමානත්වයක් ද දර්ශනය වේ.

වර්තමාන සමාජ විද්‍යාත්මක පර්යේෂණ සමාජයක හා සමාජ ව්‍යුහය වටහා ගැනීමට වෘත්තීන් හා වෘත්තීය ක්‍රියාකාරකම් හා සම්බන්ධයෙන් සමාජ ශ්‍රේණි පිළිබඳ මහත් දැනුමක් අවශ්‍ය බව පෙන්වා දෙයි. වෘත්තියකට අනුකූලතාවයක් දක්වන තත්ත්වය මැනීම පිණිස එක් මිනුමක් වූයේ එහි ගරුත්වය යි. එය අධ්‍යනයෙන් අධ්‍යයනයට වෙනස් වන වෘත්තීය පරිමාණ මනිනු ලබන නිර්ණායකයන් ය. කිසියම් සමාජයක නිර්මාණය කරන ලද බොහෝ පරිමාණයන් අධ්‍යයනයට ලක් වී ඇති අතර ප්‍රමිත අන්තර්ජාතික ගරුත්ව පරිමාණයක් (Standard International Prestige Scale - SIPS) සාර්ථකව නිමවා ඇත.

වර්ෂ 1977 දක්වා වෘත්තීය ස්ථානගත වීම් සැලසුම් කිරීමට විධිමත් අධ්‍යයන හෝ පර්යේෂණ සිදු වී නොමැති බව සුසිලා නීල්ස්ට (Niles, 1978) අනුව පැහැදිළි වේ. කෙසේ වෙතත්, වෘත්තීය ගරුත්වය හා සමීප විෂයයක් වශයෙන් වෘත්තිකයන්ගේ ආකල්ප ද අවධානයට ලක්කෙරිණි. වර්ෂ 1953 දක්වා ඇතට දිවෙන වෘත්තිකයන්ගේ ආකල්ප පිළිබඳ අධ්‍යයනයන්හි ආරම්භයට දශක හයකට වැඩි ඉතිහාසයක් ඇත.

වෘත්තීය ගරුත්වයෙහි ආකල්ප පිළිබඳ ලාංකීය අධ්‍යයනයන්හි සමාරම්භකයන් වශයෙන් ටී. එල්. ග්‍රීන් හා චිත්‍රා වික්‍රමසූරිය (Green, & Wickramasooriya, 1953) යන විද්වතුන්ගේ නම් නීල්ස් (Niles, 1978) ඇතුළු පර්යේෂකයන්ගේ වාර්තාවන්හි සඳහන් වේ. ග්‍රීන් හා චිත්‍රාගේ ලාංකීය උපාධිධාරී ගුරුවරුන්ගේ වෘත්තීය ආකල්ප (The Vocational Attitudes of Ceylonese Graduate Teachers) යන අධ්‍යයනයේ මූලික අරමුණ වූයේ උපාධිධාරී ගුරුවරුන් කණ්ඩායමක් අතර ශ්‍රී ලංකාවේ පොදු වෘත්තීන් ගණනාවක සාපේක්ෂ තත්ත්වය කෙරෙහි ඇති ආකල්ප අධ්‍යයනය කිරීමත්, ගරුත්ව තත්ත්වය සහ ආර්ථික තත්ත්වය අතරැති සම්බන්ධතා විමර්ශනය කිරීමත් හා සොයාගැනීම්වල ගැටලු සාකච්ඡා කිරීමත් ය.

එම අධ්‍යයනයේ පර්යේෂණාත්මක කණ්ඩායම සඳහා සහභාගි වූ ගුරුවරුන් පිරිස 1951-1952 අතර ලංකා විශ්වවිද්‍යාලයේ අධ්‍යාපන ඩිප්ලෝමා පාඨමාලාව සඳහා ලියාපදිංචි වූ පුරුෂ පක්ෂයේ (එහි ම) උපාධිධාරීන් 48කි. අඩු වශයෙන් අවුරුදු 5ක සේවයක් සහිත පළපුරුදු ගුරුවරුන් වූ ඔවුහු ගැටලු විසඳීම පිණිස උපදේශන කාර්යයන් සම්බන්ධව සමීපස්ථ පුද්ගලයෝ වූහ. පර්යේෂණ ක්‍රමවේදය වශයෙන් එක් එක් ගුරුවරයාට වෘත්තීන් 176ක ලැයිස්තුවක් දෙන ලදින්, වෘත්තීය තත්ත්වය අනුව, එක් එක් වෘත්තිය A, B, C, හා D ලෙස අනුපාතකරණය පිණිස උපදෙස් දෙන ලදි. මුල් ලේඛනයෙහි සංවර්ග 4 සඳහා 4, 3, 2 හා 1 වශයෙන් භාරයෙන් (weight) යුතුව ලකුණු දෙන ලදි. එක් එක් වෘත්තිය සඳහා සමස්ත ලකුණු ගණනය කර, සමස්ත ශ්‍රේණි මාලාව, අංකිත පටිපාටිය අනුකූලව, ශ්‍රේණි වශයෙන් වින්‍යාස කරන ලදි. රජයේ රැකියාවන්හි ආර්ථික තත්ත්වයන් හැකි තරම් පහසු පරිදි යෝග්‍ය මූලාශ්‍ර විමර්ශනය කිරීමෙන් නිශ්චය කරන පද අතර ද්විතීය ශ්‍රේණි පටිපාටියක් ඉදිරිපත් කිරීම පිණිස වැටුප් පරිමාණයන්හි ඉහළ සීමාවක් භාවිත කෙරිණි. මෙකී ශ්‍රේණි පටිපාටි කට්ටල ද්වය, සහසම්බන්ධතාව හා අන්‍ය විධික්‍රම මගින් සංසන්දනය කරන ලදි.

ලාංකීය උපාධිධාරී ගුරුවරුන්ගේ වෘත්තීය ආකල්ප නමැති පර්යේෂණයේ ප්‍රතිඵල වශයෙන් ස්ථානීය ලකුණු (point Score) 151ක් ලබා ශ්‍රේණි පටිපාටිය අනුව විශ්වවිද්‍යාල මහාචාර්යවරයා පළමුවන වෘත්තිය බවට පත් වී ඇත. පිළිවෙළින් ස්ථානීය ලකුණු 147ක් හා 146ක් ලැබූ වෛද්‍යවරයා 2 වන වෘත්තිය ද, සිවිල් සේවකයා 3 වන වෘත්තිය ද බවට පත් වී ඇත. බොහෝ පර්යේෂණ අධ්‍යයනයන්හි හා ජාතික වශයෙන් හඳුන්වා දෙන ලද සම්මතයන්හි ඉතා ඉහළ වෘත්තියක් වශයෙන් ගරුත්වයට පාත්‍ර වූ නීතිඥවරයා ස්ථානීය ලකුණු 89ක් ලබා 38 වන ස්ථානයට පත් විය.

ලාංකීය උපාධිධාරී ගුරුවරුන්ගේ වෘත්තීය ආකල්ප පිළිබඳ අධ්‍යයනය අනුව වෘත්තීය ගරුත්වයෙන් පහළ අගයක් වූ ස්ථානීය ලකුණු 37ක් හිමි වූ මුරකරු 80 වන වෘත්තිය හා ස්ථානීය ලකුණු 36ක් ලැබූ කම්කරුවන් 81 වන වෘත්තිය වශයෙන් ස්ථානගත වී ඇත. එම අධ්‍යයනයෙහි පුස්තකාල සේවාව හෝ පුස්තකාලයාධිපති තනතුර පිළිබඳ තොරතුරු සඳහන් නොවේ.

ශ්‍රී ලංකාවේ පුස්තකාලයාධිපතිවරුන්ගේ වෘත්තීය ස්ථානගත වීම් අධ්‍යයනය කෙරෙන පර්යේෂණ මාතෘකාවට ආසන්න සම්බන්ධතාවක් ඇති පර්යේෂණයක් පවත්වා ඇත්තේ 70 දශකය අගභාගයේ දී ය. නීල්ස්ට (Niles, 1978) අනුව ශ්‍රී ලංකාවේ වර්ෂ 1977 වනතුරු වෘත්තීය ස්ථානයක් සැලසුම් කිරීමට ප්‍රයත්න දරා නැත. නීල්ස් (එහි ම) ශ්‍රී ලංකාව සඳහා සුවිශේෂී වූ වෘත්තීය ස්ථානයක් නිර්මාණය කර ගැනීමට සුදුසු පසුබිම ගොඩනැගෙන අධ්‍යයනයක් කර ඇත. නීල්ස්ගේ එම අධ්‍යයනයෙහි විශේෂත්වය වන්නේ සියලු වෘත්තීන් ප්‍රධාන වෘත්තීය කාණ්ඩ 7ක් යටතේ වර්ගීකරණය කර සියලු වෘත්තීන් අන්තර්ගත වන පරිදි විද්‍යාත්මක අයුරින් කාණ්ඩගත කිරීම යි.

පහත සඳහන් විස්තරාත්මක මාතෘකා යටතේ අනුපාතයන් තීරණය කිරීමේ එකගත්වය අනුව (අ). සිට (උ). දක්වා සංවර්ග 7කට කාණ්ඩගත කෙරිණි. මෙම වර්ගීකරණයට අවශ්‍ය මූලික පදනම සකස්කර ගැනීමට ප්‍රමිත බ්‍රිතාන්‍ය වෘත්තීය වර්ගීකරණයෙහි කේත මාලාව අනුගමනය කර ඇත.

(අ). වෘත්තීය හා ඉහළ පරිපාලනය

(ආ). කළමනාකරණ හා විධායක (ශ්‍රේණි)

(ඇ). සුපරීක්ෂක, (වැඩ පරිපාලක), කාර්මික හා අන්‍ය අත්හුරු නොවන (ඉහළ ශ්‍රේණිය)

(ඈ). සුපරීක්ෂක, (වැඩ පරිපාලක), කාර්මික හා අන්‍ය අත්හුරු නොවන (පහළ ශ්‍රේණිය)

(ඉ). පුහුණු කම්කරු හා අත්හුරු නොවන පටිපාටිගත ශ්‍රේණි

(ඊ). අර්ධ පුහුණු

(උ). නුපුහුණු

සාමාන්‍යයෙන් වඩාත් සංකීර්ණ සමාජයන්ට යොදාගත හැකි ඉහත සඳහන් විචිත්‍ර සංවර්ගීකරණයක් ශ්‍රී ලංකාව වැනි රටකට යෝග්‍ය නොවිය හැකි බවට මතවාද පැවතිය ද, ශ්‍රී ලංකාවේ වෘත්තීන් ඒ ඒ සංවර්ගය ඇතුළත, පරාසය හා විවිධත්වය මඳ වුවත්, එකී එක් එක් සංවර්ගයන්ට ගැළපෙන වෘත්තීන් පහසුවෙන් හඳුනාගත හැකි බව නිරීක්ෂණය විය. මේ පරිමාණය වාසි සහගත වීමට කරුණක් වන්නේ එය ශ්‍රී ලංකා සමාජයේ දක්නා ලැබෙන විශේෂත්වයන් සලකා බැලීමෙන් අනතුරුව සැලසුම් කිරීමයි. උදාහරණ වශයෙන් ඉහත සඳහන් වෘත්තීන්හි විශිෂ්ටත්ව, හා පුද්ගලයෙකුගේ වෘත්තීය ගරුත්වය මත ආරෝපිත කුල ක්‍රමයෙහි වක්‍ර බලපෑම දැක්විය හැකිය.

අනුපාතකරණය පිණිස අවශ්‍ය වන අනුපාතිකයන් තීරණය කිරීම සඳහා පූර්වයෙන් සඳහන් කරන ලද නියමු අධ්‍යයනය ආධාරයෙන් වෘත්තීය ලේඛනයක් සකස්කර ගෙන ඇත. එබැවින් නියමු නියැදියට සමරූපී වීමට ඇතිකරගත් එකඟතාව අනුව යථෝක්ත වෘත්තීන් සමානත්වයට පත් කිරීම මගින් එකී ලේඛනය වෘත්තීන් 38කට පමණක් සීමා කර මෙම අධ්‍යයනය සිදුකර ඇත. මෙම අධ්‍යයනයේ දී පුස්තකාලයාධිපති වෘත්තීය ස්ථානගත වී ඇත්තේ ඉතා අවම පිළිගැනීමක් සහිත ස්ථානයක බව (එහි ම) සඳහන් වේ.

ඒ අනුව විද්‍යාඥයින්, විශ්වවිද්‍යාල මහාචාර්යවරුන්, සමග ද, තැපැල් ස්ථානාධිපති, දුම්රිය ස්ථානාධිපති සමග ද, කාර්යාල සහකාර, පුස්තකාලයාධිපති හා වැඩ මූලික, වැඩ පරිපාලක සමග ද (එහි ම) ආදී වශයෙන් වෘත්තීන් සමාන කර ඇත. මේ සමාන කිරීම වැඩිදුරටත්, ස්වාධීන විනිශ්චයකාරවරුන් දෙදෙනකු විසින් එකී කාණ්ඩගත කිරීම පරීක්ෂා කිරීමෙන් අනතුරුව එහි නීත්‍යානුකූලභාවය සහතික කර ඇත.

ශ්‍රේණිවලට අයත් කාර්යමණ්ඩල පිළිබඳ මූලික පරීක්ෂණයේ දී අනාවරණය වූයේ අත්හුරු වැඩකරුවන් හෝ පහළ වෘත්තික සංවර්ගයන් විසින් ප්‍රධාන වශයෙන් ඔවුන් ලබාගත් පුහුණුව අල්ප බව හේතුවෙන් එකී අදාළ කාර්යයන් සාර්ථකව ඉටුකිරීමට අවශ්‍ය දැනුම නොතිබූ බවයි. මෙයින් පුහුණු හා නුපුහුණු වෘත්තීන් විෂයෙහි මෙම නියැදියේ ප්‍රතිඵල සීමා කිරීමට හේතුවුවද, මෙම පරාසය ඇතුළත හැකිතරම් බොහෝ විවිධත්වයක් අත්පත් කර ගැනීමට උත්සුක වී ඇත.

ප්‍රශ්නාවලියක් ඇසුරෙන් දත්ත ලබා ගැනීම සඳහා පිළිතුරු ලැබීමේ අනුපාතය සම්පූර්ණ කරන ලද පිළිතුරු පත් 30ක්, එනම්, 60%ක් පමණක් වීම මන්දෝත්සාහී බවට හේතුවක් විය. නියැදියට ඇතුළත් බොහෝ දෙනෙක්, මධ්‍යම මට්ටමේ වෘත්තීන්ට තමන්ගේ මතය පළකිරීම ඉතා දුෂ්කර කාර්යයක් වූ බවට අදහස් ප්‍රකාශ කර ඇත. එක් එක් සංවර්ගයට අයත් වෘත්තීන් වැදගත්කමේ අනුපිළිවෙළට අනුව ඔවුන් විසින් ශ්‍රේණිගත කළ යුතු විය.

වෘත්තීන්ගේ ගරුත්වය පිළිබඳ අවසාන ශ්‍රේණි පිළිවෙළ සකස් කිරීමේ දී සමස්ත නියැදිය විසින් උපයාගත් ලකුණු ප්‍රමාණය හා ලබාගත් මධ්‍යන්‍යය ලකුණු සියල්ල ගණනය කරන ලදි. මධ්‍යන්‍යය ලකුණු ප්‍රමාණය පදනම් කර ගෙන, ඉන් අනතුරුව, ඒ ඒ වෘත්තීන් ලබාගත් ස්ථානීය අනුපිළිවෙළට අනුව වෘත්තීන් ශ්‍රේණිගත කෙරිණි. පහළ ම ලකුණු ලබාගත් වෘත්තිය වූ කම්කරුවන් පළමුවැන්න (01) ලෙස ශ්‍රේණිගත කළ අතර, පරිමාණය ඉදිරියට ගෙනයමින් උසස් ම වෘත්තිය වශයෙන් විනිශ්චයකරු පළමුවන කාණ්ඩයට අයත් වී මධ්‍යන්‍යය ලකුණු 84ක් ලබා 38 වන වෘත්තිය හෙවත් උසස්ම වෘත්තිය එනම්, පළමුවන වෘත්තිය වශයෙන් ශ්‍රේණිගත වී ඇත.

මධ්‍යන්‍යය ලකුණු 83ක් ලබා වෛද්‍යවරු 37 වන වෘත්තිය හෙවත් දෙවන වෘත්තිය වශයෙන් ද ශ්‍රේණිගත විය. එහි දී පුස්තකාලයාධිපති තෙවන කාණ්ඩයට අයත් වී මධ්‍යන්‍යය ලකුණු 61ක් ලබා 21 වන ස්ථානය (එහි ම) හිමි කර ගෙන ඇත. මෙහි සැලකිය යුතු අඩුපාඩුවක් වන්නේ, සපයන ලද නියැදි 50ක් අතුරෙන් ප්‍රතිචාර දැක්වූ 30ක් පමණ සීමිත නියැදි ප්‍රමාණයකට ලැබුණු ප්‍රතිචාර මත පදනම් වීමෙන් සැලසුම් කිරීම යි.

ශ්‍රී ලංකාව සඳහා වෘත්තීය ස්ථානයන් ගණනය කිරීමේ ක්‍රමවේදයක් පිළිබඳ විධිමත් පර්යේෂණයක් චන්ද්‍රා ගුණවර්ධන (Gunawardana, 1990) විසින් කර ඇත. එම පර්යේෂණ අධ්‍යයනයේ ප්‍රමුඛ අරමුණ වූයේ නීල්ස්ගේ අධ්‍යයනයේ පැවති වැරදි ප්‍රතිශෝධනය කිරීම යි. විස්තාරණය කරන ලද එකී නියැදිය මගින්, වඩාත් විශ්වාසදායක පරිමාණයක් අනුව සැලසුම් කළ හැකි යැයි එහි දී උපකල්පනය කර ඇත.

අවුරුදු දශකයක කාල සීමාව ඇතුළත සිදු වූ වෘත්තීය ධුරාවලියෙහි ඇති වූ වෙනස්කම් පෙන්වා දෙමින් නීල්ස්ගේ පරිමාණය සංසන්දනය කර ඇත. වැඩිදුරටත් මේ අධ්‍යයනයේ දී මෙම පරිමාණය අංකනය 100ක් තරම් පුළුල් වෘත්තීය ශ්‍රේණි

පරාසයක් උදෙසා සංවර්ධනය කිරීමට පරිශ්‍රමයක් දරන ලද හෙයින් ශ්‍රී ලාංකිකයන් යෙදී සිටින වැඩි වෘත්තීන් ගණනක් ශ්‍රේණිගත කිරීමට හැකියාව ලැබී ඇත.

සුසිලා නීල්ස්ගේ පරිමාණය ශ්‍රී ලංකාව සඳහා විශේෂයෙන් සැලසුම් කළ ද එය සීමාසහිත නියැදියක් මත පදනම් විය. පුළුල් නියැදියක් අන්තර්ගත ගුණවර්ධනගේ අධ්‍යයනය වර්තමාන සමාජය උදෙසා ඉමහත් වලංගුතාවක් සහිත වෘත්තීය ස්ථානගත කිරීම නිර්මාණය කිරීමේ අරමුණින් ඉදිරිපත් කර තිබේ. මේ අධ්‍යයනය ශ්‍රී ලංකාවේ සමාජ පංති හා ස්ථරායන හඳුනා ගැනීමට ඒක මානීය වශයෙන් භාවිත කිරීමේ හැකියාව ඇති වෘත්තීය ගරුත්ව පරිමාණයක් ලෙස සංවර්ධනය කිරීමට අපේක්ෂා කර නැත.

අධ්‍යයනයේ ප්‍රථම පියවර ශ්‍රී ලංකා ප්‍රමිත වෘත්තීය වර්ගීකරණයෙහි (Standad Occupational Classification for Sri Lanka - SOCSL) ලේඛනගත කරන ලද වෘත්තීන් සංඛ්‍යාව අඩු කර ගැනීමේ ශීඝ්‍ර අවශ්‍යතාව වෙනුවෙන් අධ්‍යයනයක් කෙරිණි. ඒ අනුව වෘත්තීන් 373කින් සමන්විත එම ලේඛනය ඒ ඒ වෘත්තියට දෙන ලද ගරුත්වය අනුව ශ්‍රේණිගත කිරීමට ප්‍රථමයෙන් එකී වෘත්තීන් ගණන අඩුකර ගැනීමට අවශ්‍ය විය. ඒ අනුව පර්යේෂණ අධ්‍යයනයට සුදුසු පරිදි වෘත්තීන් කාණ්ඩගත කර ගැනීම සඳහා විවිධ නිර්ණායක යටතේ මූලික අධ්‍යයනයක් කෙරිණි.

පූර්වෝක්ත පසුබිම යටතේ විවිධ අධ්‍යාපන මට්ටම් සහිත හා වෙනස් ජීවිකා වෘත්තීන්හි නිරත පුද්ගලයින් ඇතුළත් නියැදියකට මූලික ලේඛනයේ නියෝජනයන් අනුසාරයෙන් ප්‍රශ්නාවලී ඉදිරිපත් කරන ලදි. එමගින් කරන ලද ඉල්ලීම වූයේ පර්යේෂණයට භාජිත වූවන් මගින් ලේඛනගත වෘත්තිකයින් 373 දෙනෙකුගෙන් බොහෝ සෙයින් වෘත්තිකයන් 100ක් (එහි ම) තෝරාගැනීම යි.

මහාචාර්ය චන්ද්‍රා ගුණවර්ධන විසින් කරන ලද වෘත්තීය ස්ථානගත කිරීම අනුව කෙරෙන රැකියා වර්ගීකරණයේ දී (එහි ම) පෙනී ගියේ සමීක්ෂණයට භාජනය කරන ලද රැකියා 100 අතුරින් පුස්තකාලයාධිපතිත්වය 41 වන තැන ලබා ඇති බව ය. ඒ අනුව පුස්තකාලයාධිපති තනතුර ස්ථානගත වී ඇත්තේ පොල් වතු අධිකාරී (40 වන ස්ථානය) හා ඖෂධවේදී (42 වන ස්ථානය) රැකියා දෙක අතර බව පෙන්නුම් කෙරේ. ගුණවර්ධනයන් රැකියා කාණ්ඩ 6ක් යටතේ විශ්ලේෂිත වෘත්තීන් ස්ථානගත කිරීම අනුව පුස්තකාලයාධිපති වෘත්තියෙහි ස්ථානගත වීම වගු අංක 03හි දක්වා ඇත. ඒ අනුව පුස්තකාලයාධිපතිවරයෙකුගේ රැකියාවේ සමාජ තත්ත්වය සමාන වූයේ විශේෂිත වෘත්තීය කුසලතා රහිත තෙවන කාණ්ඩයේ රැකියාවක් වශයෙනි.

**රැකියා කාණ්ඩය 3**

| ශ්‍රේණිය | වෘත්තිය | මධ්‍යනාය | සංඛ්‍යාතය | පරාසය |
|---|---|---|---|---|
| 31 | තේ වතු අධිකාරී | 65.807 | 353 | 40 |
| 32 | වෛද්‍ය කිරණ ශිල්පි | 65.767 | 340 | 80 |
| 33 | දුම්රිය ස්ථානාධිපති | 65.631 | 372 | 82 |

| | | | | |
|---|---|---|---|---|
| 34 | කර්තෘ සහ විවේචක | 64.788 | 364 | 99 |
| 35 | තැපැල් ස්ථානාධිපති | 63.819 | 372 | 74 |
| 36 | සම්පාදක හා ලේඛක | 63.669 | 366 | 85 |
| 37 | රබර් වතු අධිකාරී | 63.617 | 363 | 61 |
| 38 | කෘෂිකර්ම තාක්ෂණික ශිල්පි | 63.490 | 318 | 99 |
| 39 | වෘත්තීය හෙදි | 62.586 | 372 | 76 |
| 40 | පොල් වතු අධිකාරී | 61.582 | 366 | 78 |
| 41 | පුස්තකාලයාධිපති, රාජ්‍ය ලේඛනාගාර භාරකරු සහ කෞතුකාගාර අධිකාරී | 61.233 | 359 | 78 |
| 42 | ඖෂධවේදී | 60.933 | 363 | 71 |
| 43 | ලිපිකාර අධීක්ෂක | 60.497 | 356 | 72 |
| 44 | පූර්ව ප්‍රාථමික අධ්‍යාපන | 56.612 | 361 | 78 |
| 45 | නළු සහ වේදිකා අධ්‍යක්ෂ | 56.264 | 363 | 88 |
| 46 | ක්‍රීඩා පුහුණු කරවන්නා සහ ශාරීරික විද්‍යා පුහුණුකරු | 53.935 | 354 | 81 |
| 47 | රචක, සංගීතඥ සහ ගායක | 53.394 | 368 | 89 |
| 48 | පොත් තබන්නා සහ අයකැමි | 52.454 | 367 | 84 |

මූලාශ්‍රය : වෘත්තීය ස්ථානගත කිරීම අනුව රැකියා වර්ගීකරණ වගු අංකය : 03

පුස්තකාලයාධිපති වැනි තනතුරක් අධ්‍යාපන හා වෘත්තීය සුදුසුකම් රහිත පිරිස් සමග ශ්‍රේණිගත කිරීම වෘත්තීයේ ගරුත්ව සඳහා සෘජුව බලපෑම් ඇති කෙරේ. නීල්ස්ගේ ස්ථානගත කිරීම් අනුව පළමුවන පංතිය යටතේ ඇති වෘත්තීන් ගුණවර්ධනගේ ස්ථානගත කිරීමෙහි දක්නට ලැබේ.

වෘත්තීය කාණ්ඩ අතර සහ ඇතුළත මධ්‍යන්‍යයන්හි විවිධතා සලකා බලන විට ධූරාවලි දෙකෙහිම දෙවන පංතියේ විද්‍යමාන වෘත්තීන් වූ විදුහල්පති, සාමාන්‍යාධිකාරි, පාඨශාලා පරීක්ෂක හා නීති සම්පාදක නිලධාරීන් සමානය. ඊට සමානව රංගන ශිල්පීන්, වේදිකා අධ්‍යක්ෂ, තැපැල්පති, පුස්තකාලයාධිපති, දුම්රිය ස්ථානාධිපති, තාක්ෂණඥ (කාර්මික ශිල්පී), කර්තෘවරු, ලේඛක (පුවත්පත් කලාවේදී) හා ලිපිකාර නිරීක්ෂක යන තනතුරු (එහි ම) ධූරාවලි දෙකෙහිම තුන්වන පංතියට ඇතුළත් වේ.

**පුස්තකාලයාධිපතිත්වය පිළිබඳ දේශීය සාහිත්‍ය විමර්ශනය**

පුස්තකාල හා විඥාපන විද්‍යා සාහිත්‍යයට අදාළව පුස්තකාල වෘත්තිය, පුස්තකාලයාධිපතිත්වය, පුස්තකාලයාධිකාරිත්වය හෝ පුස්තකාල කළමනාකරණය යන මාතෘකා සම්බන්ධයෙන් මෙරට ප්‍රකාශයට පත්වී ඇති බොහෝ ශාස්ත්‍රීය ලිපිවල

ඇතැම් කරුණු පුස්තකාලයාධිපතිත්වයෙහි ස්ථානගත වීමට අදාළ කරුණු කිහිපයක් සංක්ෂේපයෙන් මෙහි සඳහන් කෙරේ.

විශ්වවිද්‍යාල පුස්තකාලයාධිපතිත්වයෙහි තත්ත්වය පිළිබඳව හිටපු විශ්වවිද්‍යාල පුස්තකාලයාධිපතිවරයකු වූ ද සිල්වාට අනුව, (De Silva, 1998) එක්සත් ජනපදය, එක්සත් රාජධානිය, ඉන්දියාව හා ශ්‍රී ලංකාව යන රටවල විශ්වවිද්‍යාල පුස්තකාලයවල ආරම්භය සංක්ෂිප්තව විස්තර කරමින් එකී පුස්තකාල ඇසුරෙන් ඒවා සංසන්දනාත්මකව අධ්‍යයනය කර ඇත. විශේෂයෙන් විශ්වවිද්‍යාල පුස්තකාලයාධිපතිත්වය අධ්‍යයන කාර්යමණ්ඩලයට අයත් වුවත්, අධ්‍යයන කාර්යමණ්ඩලය හිමි සමාජ තත්ත්වය හා වෘත්තීය ගරුත්වය කෙතරම් ප්‍රමාණයකින් ලැබී තිබේ ද යන කරුණ පිළිබඳ ව විමර්ශනය සිදුකර ඇත.

පුස්තකාල වෘත්තිකයෙකු ලෙස හැඳින්වීමේ දී වෘත්තිකයකු තුළ තිබිය යුතු මූලික ගුණාංග කීපයක් වීරසූරිය (වීරසූරිය, 2000) සඳහන් කර ඇත. එකී ලිපියේ සඳහන් කරුණු අතර පුස්තකාලයාධිපතිවරයකු විසින් අත්පත්කර ගත යුතු කුසලතා කීපයක් සඳහන් කර ඇත. ඒවා නම්, තමාගේ විෂය පිළිබඳ න්‍යායික දැනුම හා ප්‍රායෝගික පුහුණුව, අධ්‍යාපන හා පර්යේෂණ හැකියාව, තීක්ෂණ බුද්ධිය, දක්ෂ කළමනාකාරිත්වය, සේවයට කැපවීම, වෘත්තීය ගෞරවය ආරක්ෂා කිරීම, ගුණයහපත් බව, පරාර්ථකාමිත්වය හා නොසැලෙන මානසිකත්වය යන කරුණු ඒ අතරෙන් විශේෂත්වයකින් සඳහන් කළ යුතුය.

## පුස්තකාල වෘත්තියෙහි රැකියා තෘප්තියට අදාළව දේශීයව සිදු වූ පර්යේෂණ

වර්තමානයේ පුස්තකාල හා විඥාපන සේවා ප්‍රමුඛ වශයෙන් මුද්‍රිත මාධ්‍යයේ සිට ජාලීයකෘත විද්යුත් මාධ්‍යයන් දක්වා විපර්යස්ථ, අතිශය අභියෝගාත්මක විඥාපන පරිසරයකට ප්‍රවිෂ්ටවෙමින් පවතී. යථෝක්ත විද්යුත් මාධ්‍යයන්හි ඇති වූ වෙනස්වීම් හේතුවෙන් ඥාන ගවේෂණයෙන් තෘප්තිමත් උපයෝජකයෝ පුස්තකාලයවලින් ක්‍රමයෙන් ඈත්වූහ.' පුස්තකාල වෘත්තියෙහි රැකියා තෘප්තියට අදාළව දේශීයව සිදු වූ පර්යේෂණ අධ්‍යයනයන් කීපයක් ම ඇත. ශ්‍රී ලංකාවේ විශ්වවිද්‍යාලීය පුස්තකාලයන්හි වෘත්තීය කාර්යමණ්ඩලයේ රැකියා තෘප්තිය සම්බන්ධ පශ්චාත් උපාධි පර්යේෂණ අධ්‍යයන හා සම්මන්ත්‍රණ පත්‍රිකා කීපයක් ඇත. තිරුනාවුකරසු, (1994), අමරකෝන්, (1995), කුරුප්පු, (1998), විජේවීර, (2004) හා මාරසිංහ හා විජේරත්න (2014) ආදී වශයෙන් ඇත්තේ අතළොස්සක් පමණි.

මේ පර්යේෂණ අතර අධ්‍යයන දෙකක් (අමරකෝන්, 1995, විජේවීර 2004) කුඩා ප්‍රමාණයේ සීමාසහිත නියැදියකට අයත් විශ්විද්‍යාල පුස්තකාලයාධිපතිවරුන්ගේ රැකියා තෘප්තිය තක්සේරු කිරීමට පරසත්ත විචල්‍යයන් (Dependant Vadriable) වශයෙන් වයස පාදක වී ඇත. උභය අධ්‍යයනයන් රැකියා තෘප්තිය කෙරෙහි

පරම්පරානුයාත බලඇණියෙහි බලපැවැත්ම අගය නොකරන ලදී. අතිරේක වශයෙන් එකී කාල සීමාවෙහි පටන් ම, බොහෝ වෙනස්කම් පෙන්නුම් කෙරිණි.

මාරසිංහ හා විජේරත්න විසින් වර්ෂ 2014 දී කරන ලද පර්යේෂණය කරුණු කීපයක් නිසා වැදගත් වේ. විශ්වවිද්‍යාලීය අධිකාරින් වෘත්තීය කාර්ය සාධනය, නවෝත්පාදන සහ රැකියාව කෙරහි දක්වනු ලබන පොදු අනුග්‍රහකත්වය පදනම් කරගෙන අප්‍රධාන (උපකාරක) කාර්යමණ්ඩලයේ ජයග්‍රහණයන් හඳුනාගැනීමට සාර්ථක විය යුතුය. වෘත්තීය පිළිගැනීම විශේෂයෙන් ම රඳා පවතින්නේ විශ්වවිද්‍යාලීය පුස්තකාලයාධිපතිගේ පරිපාලන ශෛලිය මතය. එබඳු පිළිගැනීමක් ලිඛිත මාර්ගයන් පමණක් නොව පීඨ ආයතනය සමග අන්තර් ක්‍රියාකාරී වීම පිණිස පූරකයනට අවස්ථා සලසා දෙමින් එබඳු යෝග්‍ය පුද්ගලයන්ට වාචික වශයෙන් කරුණු ඉදිරිපත් කිරීමට ද හැකියාව ඇති බව එකී පර්යේෂණයෙහි (Marasinghe, [and] Wijayaratne (2014) සඳහන් කෙරේ.

එමගින් පුස්තකාලයාධිපතිවරුන්ට ධෛර්යමත්ව ඇප කැපවීමෙන් කටයුතු කිරීමෙන් විශ්වවිද්‍යාලය සඳහා වඩාත් ජයග්‍රහණ ලබාදීමට හැකි වන අතර, එයින් විශ්වවිද්‍යාලීය පුස්තකාලයාධිපතිවරුන්ගේ අවශ්‍යතාව හා වැදගත්කම පිළිබඳව සමාජයට, ස්වයංක්‍රියව පණිවිඩයක් ලබාදීමට ද අවස්ථාව සැලසේ. ඔවුන්ගේ උසස්වීම් සඳහා ද, ඔවුන්ගේ රාජකාරි වඩා හොඳින් ඉටු කිරීමට විශ්වවිද්‍යාල පාලනාධිකාරිය මගින් අවශ්‍ය සහයෝගය ලබාගැනීමට ද එහි ප්‍රතිඵල වශයෙන් වෘත්තීය අභිවර්ධනයට ද එය හේතු වනු ඇත. විශ්වවිද්‍යාලීය පාලනාධිකාරිය සෑම අවස්ථාවකදීම එහි පුස්තකාල වෘත්තිකයන්ට අන්‍ය අධ්‍යයන කාර්යමණ්ඩලයට මෙන් සමානව සැලකිය යුතු බව මෙම අධ්‍යයනයෙන් නිගමන කෙරේ.

**සාරාංශය**

ලේඛන කලාව හා සෘජු සම්බන්ධතාවක් ඇති වෘත්තීන් අතර පුස්තකාල වෘත්තිය ප්‍රමුඛතම වෘත්තියක් වශයෙන් හඳුනා ගැනීමට ප්‍රමාණවත් මූලාශ්‍ර පරිශීලනය කිරීමට හැකි විය. මෙකී මූලාශ්‍ර ඇසුරෙන් පුස්තකාල වෘත්තියට අදාළ විවිධ පරිපාලන නියෝග අධ්‍යයනය කෙරිණි. පුස්තකාලයාධිපති වෘත්තියෙහි වෘත්තීය තත්ත්වය සම්බන්ධයෙන් ජාත්‍යන්තර හා දේශීය වශයෙන් පුස්තකාල හා විඥාපන විද්‍යා සාර සංග්‍රහයෙහි ප්‍රකාශිත ශාස්ත්‍රීය හා පර්යේෂණ ලිපි ද, විද්වත් සඟරාවල ශාස්ත්‍රීය ලිපි ද මූලාශ්‍ර අධ්‍යයනය හා සාහිත්‍ය විමර්ශනයේ දී පාදක විය.

**විමර්ශන කෘති**

වීරසිංහ, ඩබ්ලිව්. කේ. එම්. එම්. කේ. (2000), පුස්තකාල ඉතිහාසයඃ ආරම්භයේ සිට නූතන යුගය දක්වා සංක්ෂිප්ත විවරණයකි. දළුගම ඃ කර්තෘ. පි. 7-9

වීරසූරිය, ඩබ්ලිව්. ඒ. (2000), පුස්තකාලයාධිපති වෘත්තිය හා වර්තමාන පුස්තකාලයාධිපතින්ගේ කාර්යභාරය, පුස්තකාල ප්‍රවෘත්ති,කොළඹ ඃ ශ්‍රී ලංකා ජාතික පුස්තකාල සේවා මණ්ඩලයේ ප්‍රවෘත්ති ප්‍රකාශනය, ඔක්. - දෙසැ. 21/4, පි. 10

De Silva, W.R.G. (1998). Academic status for University librarians: a comparative study. *Journal of the University Librarian's Association of Sri Lanka*. Vol. 2 no.1, p. 1-13

Green, T. L. & Wickramasooriya, C. (1953), The vocational attitudes of Ceylon graduate teachers, *University of Ceylon review*, XI, p. 10-16

Gunawardana, Chandra. (1990), An Occupational Prestige Scale for Sri Lanka, *Sri Lanka journal of educational research*: 1 (1), Maharagama: National Institute of Education. p. 75-92

Marasinghe, M. P. L. R. ,Wijayaratne, Anusha (2014), Job satisfaction among the Multigenerational Professional Librarian Workforce of Sri Lankan Universities, Information Literacy : Global Challenges, Local Solutions, *Proceedings of the NILIS Research symposium 2014*, p. 62-70.

Niles, Sushila (1978), An occupational Prestige Scale for Sri Lanka, NSR publications: *Sri Lanka journal Social Sciences*. p. 45-53.

Treiman, Donald. J. (1977). Occupational prestige - comparative perspective, New York : Academic Press.

Treiman, Donald. J. (1975), Problems of concept and measurement in the comparative study of occupational mobility, *Social Science Research*. 4 (3), University of California , Los angeles & center for policy Research, p. 183-230